සියළුම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved ]

## පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

### II පත්‍රය

### නැණ ලොවට පා නඟන හපනුන්ට මඟ කියන

### "අදිති"

පැය 01 ය මිනිත්තු 15

විභාග අංකය ..............................

1

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 63 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- පිළිතුරු 3 ක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

**1. පහත දැක්වෙන ඡේදය කියවන්න.**

බුද්ධ චරිතය සිතුවමට නගා ඇති ' සිද්ධාර්ථ ගෞතම ' පොතේ මෙන් ම ' රිදී ගහේ කතාව ' පොතේ ඇගේ චිත්‍ර ශෛලියේ විශේෂත්වයක් දැකිය හැකි ය. බයිබලයේ එන කතා ද අපූරුවට සිතුවම් කළ සිබිල් නැන්දා ළමා තරුණ වැඩිහිටි කොයි කාගේත් ආදරය දිනා ගත්තා ය. එතුමිය අපේ රටට විශාල කීර්තියක් අත්පත් කර දුන් ලේඛිකාවකි. එතුමියගේ චිත්‍ර දකින අපට දැනෙන සතුට ඇගේ ළමා වියේ සිහින පමණට ම අගනේ ය.

- ඡේදය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

i. චිත්‍ර ශෛලියේ විශේෂත්වය දැකිය හැකි යැයි සඳහන් පොත් මොනවා ද ?.

.......................................................................................................................................

ii. සිබිල් නැන්දා අපේ රටට අත්පත් කර දුන්නේ මොනවා ද ?.......................................................

iii. සිබිල් නැන්දා ආදරය දිනා ගත්තේ කාගේ ද? .....................................................................

iv. 'ඉතා ම හොඳින් ' යන්නට සමාන අර්ථයක් දැක්වෙන ලෙස ඡේදයේ යොදා ඇති පදය කුමක් ද? ....................................................

v. ''ඓ'' ශබ්දයෙන් ආරම්භ වන වචනයක් ඡේදයෙන් සොයා ලියන්න. ....................................

vi. අතීතකාල ඒක වචන ස්ත්‍රීලිංග ක්‍රියා පදයක් ඡේදයෙන් සොයා ලියන්න. ..............................

**2. පහත සඳහන් වාක්‍යයේ වචනවල ඇති වැරදි අක්ෂර නිවැරදි කරමින් නැවත ලියන්න.**

- සන්ධ්‍යාර ශබ්දයට සියලු දෙනා ම සාධුකාර දුන්හ.

.......................................................................................................................................

**3. පහත සඳහන් වගන්තිය ලිඛිත භාෂාවට හරවා නැවත ලියන්න.**

i. ළමයි පඩි ගණිමින් කන්ද නැග්ගා

.......................................................................................................................................

ii. මුනුපුරා පුදුම වෙලා පැන්සල දිහා බැලුවා.

.......................................................................................................................................

**4. පහත දී ඇති වචන නිවැරදි ව ගළපා අර්ථවත් වාක්‍යයක් බැගින් ලියන්න.**

i. රටවල් / අපට / ඇය / ලෝකයේ / සොයා / පැවරුවා ය / බැලීම ට

.......................................................................................................................................

ii. අවුරුද්ද / මේ / ම / දන්නේ / ගියා / නැතුව / ගෙවිලා

.......................................................................................................................................

**5. ගැළපෙන විරාම ලකුණු යොදන්න.**

| |
|---|
| මම පොතෙහි සඳහන් වාක්‍ය<br>යක් ලියමි |

6. **පහත සඳහන් අවස්ථාවට ගැළපෙන ප්‍රස්තාව පිරුළ තිත් ඉර මත ලියන්න.**

අදූරදර්ශී උපදෙස් දීම

..........................................................................................................................................

7. **පහත සඳහන් එක් එක් යෙදුම්වලින් ප්‍රකාශවන අදහස හිස්තැන මත ලියන්න.**

i. අබමල් රේණුවක් ..........................................................................................

ii. ඉහේ මලක් පිපුණා ..........................................................................................

8. **පහත සඳහන් එක් එක් වගන්තියෙහි උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් "✔" ලකුණ ද වැරදි නම් වැරදි "✘" ලකුණද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

i. ඔවුහු ගුවන් විදුලියට සවන් දුන්හ. (..........)

ii. මාලා ගමට පැමිණිය හ. (..........)

iii. ඈ උදෑසන ම අවදි වූවා ය. (..........)

iv. නංගිලා පුස්තකාලයට ගියාය. (..........)

9. **පහත සඳහන් ඡේදය කියවා එහි ඇති යුගල පද පමණක් තෝරා හිස්තැන මත ලියන්න.**

ගෙවත්තේ අහල පහල දුවමින් කාලය ගෙවා දමන දිනෙත්ගේ හිස අත ගාමින් තාත්තා මෙසේ කියුවේ ය. '' ඕනෑ ම කෙනෙකුට කොයිතරම් ගෙවල් දොරවල් , යාන වාහන , වතු පිටි තිබුණත් වැඩක් වෙන්නේ නැහැ , ඉගෙන ගත්තම තමයි සම්පූර්ණ කෙනෙක් වෙන්නේ.

(..........................................................................................................................................)

10. **පහත සඳහන් වාක්‍යය බහු වචන වාක්‍යයට හරවා ලියන්න.**

ශිෂ්‍යාව උදෑසන ම පාසලට පැමිණියා ය.

..........................................................................................................................................


11. **එක් එක් ඉංග්‍රිසි වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.**

i.Water - ..............................................................

ii.School Flag - ..............................................................

12. **එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රිසි වචනය දී ඇති කොටුව තුළ ඉංග්‍රිසි අකුරෙන් ම ලියන්න.**

i.



| | | | |
|---|---|---|---|
| F | _ | _ | _ |

ii.



| | | | | | | |
|---|---|---|---|---|---|---|
| F | | | g | | | s |

13. පහත දී ඇති වචන නිවැරදි ව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

i. assembly / Monday / is / Morning / on

..........................................................................................................................

ii. my / I / teeth / brush

..........................................................................................................................


14. ''තපාල් කාරියාලයම් '' යන දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල වචනය සිංහල අකුරින් ම ලියන්න.

..............................................................................

15. පහත සඳහන් වාක්‍යය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

වායි කළුවුංගළ් : ..............................................................................


16. ''හාරදහස් දහඅට'' සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න. ...................................................................

17. 

රූපයේ දැක්වෙන දොඩම් ගෙඩි ගණන රෝම සංඛ්‍යාවෙන් ලියන්න. : ...............................

18. 2099 ට පෙර සංඛ්‍යාවෙත් පසු සංඛාවේත් එකතුව කීයද ? : ..........................................................

19. පාසල් ආරම්භ වන්නේ පෙ.ව. 7.30 ට ය එම වේලාව පහත ඔරලෝසු මුහුණතේ පැහැදිළිව ඇද දක්වන්න.




20.

| | |
|---|---|
| 2 | 0 |
| 9 | 8 |

කොටුව තුළ ඇති ඉලක්කම් හතර ම යොදාගෙන සෑදිය හැකි විශාලතම සංඛ්‍යාව ලියන්න. .........................................

21. රුපියල් 1500.00 ක් අතැති අයෙක් රුපියල් 875.00 ක් වටිනා පොතක් මිල දී ගත් විට ඉතුරුවන මුදල කීය ද? .........................................................

22. සංඛ්‍යා රටාවේ හිසතැනට ආ යුතු සංඛ්‍යාව ලියන්න.

35 , 30 , ................ , 20 , 15 , ................., 5

23. මීටර් 1ක් දිග වයරයක් රු. 24.00 කි . 250 cm දිග වයරයක මිල කීය ද?. ..........................................

24. වට්ටියකට මල් 105 බැගින් දමා සදා ඇත. එවැනි වට්ටි 5 ක ඇති මුලු මල් ගණන කීය ද?

...............................................

25. පුටු 648 ක් එක් පේළියකට 4 බැගින් පෙළගස්වන ලදී. එසේ සැකසූ පේළි ගණන කීය ද?

...............................................

**26. පොල්තෙල් ලීටර 5 ක් ඇති භාජනයකින් 750 ml ක් ප්‍රයෝජනයට ගත් පසු ඉතුරු පොල් තෙල් ප්‍රමාණය කොපමණ ද?. ..................................................**

**27. 2kg 750g ක් බර පැපොල් ගෙඩියක් හා 3 kg 250 g ක් බර වට්ටක්කා ගෙඩියක් ලොකු තරාදියකට එකවර දමා කිරන ලදී . එහි සඳහන් වන බර වන්නේ. ..................................................**

**28. පංතියක ළමයින් 36 කි. එයින් 1/4 ක් පැමිණියේ නැත. පැමිණි සිසුන් ගණන කීය ද? ..................**

- 2022 වර්ෂයේ මැයි මාසයේ දින දර්ශනය පහත දැක්වේ.

| සඳු | අඟ | බදා | බ්‍රහ | සිකු | සෙන | ඉරි |
|---|---|---|---|---|---|---|
| | | | | | | 1 |
| 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
| 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 |
| 16 | 17 | 18 | 19 | 20 | 21 | 22 |
| 23 | 24 | 25 | 26 | 27 | 28 | 29 |
| 30 | 31 | | | | | |

**29. දින පහ බැගින් ඇති දවස් මොනවා ද? ..................................................................................................**

**30. ජූනි මස 4 වෙනිදා කවදා ද? ......................................................**

**31. අඟහරුවාදා දවස්වලට යෙදෙන දිනයන්ගේ එකතුව කීය ද? ........................................................**

- **අංක 32 සිට 62 තෙක් එක් එක් ප්‍රශ්නයකට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.**

**32. පරාග පෝෂණයට දායක වන කෘමි සතෙකු වන්නේ**
1. පැණි කුරුල්ලා 2. වවුලා 3. මී මැස්සා

**33. ප්‍රෝටීන් අඩංගු ශාකමය ආහාරයක් වන්නේ.**
1. මස් 2. ගොටු කොළ 3. දඹල

**34. ''ස්වයංපෝෂිත රටක ඉරහඳ පවතින තෙක් ධර්මය ආරක්ෂා කරමින් මුළු මහත් ජනතාව වැජඹේවා'' යන සමස්ත අදහස පිළිබිඹු වන්නේ,**
1. ධර්ම චක්‍රය මගින් 2. ජාතික කොඩිය මගින් 3. රාජ්‍ය ලාංඡනය මගින්

**35. ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය වන්නේ,**
1. ජය ශ්‍රී මහා බෝධිය 2. පොල් ගස 3.නා ගස

**36. ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් ඉටුවන සේවාවක් වන්නේ.**
1. වාහන ආදායම් බලපත්‍ර නිකුත් කිරීම.
2. පෙළ පොත් බෙදා හැරීම
3. ඉතිරි කිරීමේ ගිණුම් පවත්වාගෙන යාම

**37. '' රත්න දීප ජන්ම භූමි - ලංකා දීම විජය භූමි'' යන ගීතය ගායනා කරනු ලැබුවේ.**
1. ඩබ්ලිව්. ඩී. අමරදේව මහතා.
2. නන්දා මාලනී මිය
3. සුනිල් ශාන්ත මහතා

38. පෙති ගලවා එකි නෙකට වෙන්කළ හැකි මලක් වන්නේ.

1. සල් මල් 2. වට්ටක්කා මල් 3. රුක් අත්තන මල්

39. මුල් මගින් ශාකවලට ජලය උරා ගන්නා බව සොයා බැලීමට වඩාත් සුදුසු ශාකයක් වන්නේ.

1. මිරිස් 2. තක්කාලි 3. කුඩලු

40. ඖෂධ සඳහා පොතු යොදා ගන්නා ශාකයක් වන්නේ.

1. පාවට්ටා 2. සැවැන්දරා 3. හාතාවාරිය


41. ශ්‍රී ලංකාවට ආවේණික ක්ෂීරපායී සතෙකු වන්නේ.

1. කළු වඳුරා 2. වලිකුකුළා 3. තිත් මුවා

42. පාද හයක් ඇති සතෙකු වන්නේ.


1. මකුළුවා 2. මී මැස්සා 3. ගෝනුස්සා

43. ශ්‍රී ලංකා සිතියමේ ලකුණු කොට ඇති පළාත වන්නේ,



1. සබරගමු පළාත
2. උතුරු මැද පළාත
3. ඌව පළාත

44. මෙම පරිපථ අතරින් බල්බය නොදැල්වෙන්නේ,




45. මෙම සංකේතයෙන් අදහස් වන්නේ,



1. කසළ දැමීම තහනම්.
2. කසළ බඳුනට දමන්න.
3. ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය මෙහි දමන්න.

46. බීජයක් පැළවීමට අත්‍යවශ්‍ය නොවන සාධකයකි.

(1). සරුපස (2). තෙතමනය (3). වාතය

47. '' වන පැත්ත බියපත්ව සයනම් '' මෙම වන්නම වන්නේ,

(1). මුසලඩි වන්නම (2). තුරඟා වන්නම (3). ගජගා වන්නම

48. නියන හා අතකොළුව විශේෂයෙන් භාවිතා කරන්නේ කුමන කර්මාන්තයේද?

(1). කෘෂි කර්මාන්තයේ (2). වඩු කර්මාන්තයේ (3).පෙදරේරු කර්මාන්තයේ

49. කරකැවීම පහසු කිරීම සඳහා ලිහිසිතෙල් (කළුතෙල් ) දැමීම සිදුකරනු ලබන අවස්ථාවකි.

(1). පාපැදි දම් වැලට (2). හිරමනයට (3). විදුලි පංකාවට

**50. අව අටවක දින අහසෙහි සඳ දැක ගත හැකි ආකාරය තෝරන්න.**

(1)  (2)  (3) 

**51. මිල දී ගන්නා සිසිල් බීම බෝතලයක මධ්‍යම සීනි ප්‍රමාණයක් අඩංගු බව පෙන්වන වර්ණය කුමක්ද?**

(1). රතු (2). කහ (3). කොළ

**52. මාලිමා යන්ත්‍රයක එහි දර්ශකය නිරතුරුව ම උතුරු දිශාවට හැරී පවතියි. එය ඔබට වෙනස් කිරීමට අවශ්‍ය වූ විටෙක කළහැකි වන්නේ,**

(1). මාලිමාව සුළං හමන ස්ථානයකට ළං කිරීමෙන්
(2). මාලිමාව ජල වාෂ්පයට හසුකිරීමෙන්
(3). මාලිමාව දෙසට චුම්බකයක් ළං කිරීමෙන්

**53. පෘථිවියේ ජීවත්වන අපට දිවා රෑ ඇති වීම සිදුවන්නේ,**

(1). සූර්යයාගේ බලපෑම නිසාය.
(2). පෘථිවියේ පවතින ගුරුත්වාකර්ෂණ බලය නිසය.
(3). පෘථිවියේ භ්‍රමණය නිසාය.

**54. සන්නිවේදනයක් සිදුවීමට ප්‍රධාන අංග තුනක් සපිරිය යුතුය. එම අංග තුන අඩංගු පිළිතුර තෝරන්න.**

(1). යවන්නා , මාධ්‍යය , ලබන්නා
(2). ලිපිය , අඩංගු කරුණු , ලබන්නා
(3). විදුලිය , රූපවාහිනිය , වෙළඳ දැන්වීම්

**55. '' ඔවා මුතු දම '' '' ශ්‍රී පාදය '' යන කෘති රචනා කරනු ලැබුවේ,**

(1). ආචාර්ය ආනන්ද කුමාරස්වාමි මහතා
(2). එස් . මහින්ද හිමි
(3). ඕල්කට්තුමා

**56. අන්තර්ජාල පහසුකම් භාවිතයෙන් වේගවත්ව ලිපි යැවීම සිදුකරනු ලබයි. එසේ සිදු කරනු ලබන්නේ,**

(1). ටෙලිමේල් මඟින්
(2). විද්‍යුත් තැපැල මඟින්
(3). ලියාපදිංචි ලිපි මඟින්

**57. කාබනික පොහොර භාවිතයේ ඇති වාසියකි.**

(1). අධික ලෙස මුදල් වැය වීම.
(2). ජීවීන්ට අහිතකර වීම.
(3). විෂ රහිත ආහාර ගැනීමට හැකිවීම.

**58. බස්රථයක ගමන්කරන විට වඩාත් ආරක්ෂාකාරී පිළිවෙළ වන්නේ,**

(1). පිටුපස දොරෙන් නැඟ ඉදිරි දොරෙන් බැසයාම.
(2). ඉදිරි දොරෙන් නැඟ පිටුපස දොරෙන් බැස යාම.
(3). රියදුරු අසුන ළඟින් සිට ඔහු සමඟ කතා කිරීම.


**59. තම්බා පාන වර්ගයක් ලෙස සකස්කර ගන්නා දෑ පමණක් අඩංගු වන්නේ,**

(1). බෙලිමල් , රණවරා , ඉරමුසු

(2). රණවරා , ගොටුකොළ , නෙල්ලි

(3). ඉරමුසු , වැල්පෙනෙල , කහ

**60. රූපයේ දැක්වෙන ආකාරයට භාජනයට ජලය පුරවා A , B , C ස්ථාන 3 සිදුරුකළ විට වැඩිම දුරක් ජලය විහිදී යන්නේ කුමන සිදුර මඟින්ද?**




(1). B

(2). C

(3). A

**61. සුළඟ ආධාරයෙන් පැතිරී යන බීජ පමණක් අඩංගු පිළිතුර තෝරන්න.**

(1). වරා , හොර , මුං

(2). ඔලිඳ , මදටිය , අඹ

(3). අඟුණ , කැලණිතිස්ස , මොනරකුඩුම්බිය

**62. ශ්‍රී ලංකාවෙන් ලෝකයට හඳුන්වාදුන් ක්‍රීඩාව වන්නේ,**

(1). එල්ලේ ක්‍රීඩාව (2). වොලිබෝල් ක්‍රීඩාව (3). පාපන්දු ක්‍රීඩාව

**63. '' මල් සුවඳ විඳිමින් ඒවායේ පැණි රස බලමින් සතුටින් ජීවත් වීමට ලැබීම වාසනාවකි. '' යනුවෙන් සමනලයන් සිතනවා ඇති. '' මම සමනලයෙක් වෙමි ''**

යන්න මාතෘකාව කරගනිමින් වාක්‍ය තුනක් ලියන්න. ( සෑම වාක්‍යයක් ම වචන පහකට නොඅඩු විය යුතුයි. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුයි. )

1. ................................................................................................................................

................................................................................................................................

2. ................................................................................................................................

................................................................................................................................

3. ................................................................................................................................

................................................................................................................................